# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2213/39 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 10/2017 (III).

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

8 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක වන මේ නියමය මගින්, ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික තැනැත්තකු විසින්-

(අ) යම් විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල්, ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමේ දී හෝ ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේ දී;හෝ

(ආ) ශ්‍රී ලංකාව තුළ, විදේශ විනිමය තම සන්තකයේ හෝ බැංකු ගිණුමක තබා ගැනීමේ දී,

යටත් විය යුතු මෙහි I උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇතිපරිදි වූ කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි,මෙයින් නියම කරනු ලැබේ. 2020 ජූලි මස 1 වැනි දින අංක 2182/33 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 8 වන වගන්තිය යටතේ සාදන ලද නියමය, එය යටතේ කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් අවලංගු කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

1A - G 33647 — 60 (2021/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

I වන කොටස

**විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් අපනයනය කිරීම සහ ආනයනය කිරීම සම්බන්ධයෙන් වන කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි**

1. (1) ශ්‍රී ලංකාවෙන් පිටතට යන්නා වූ හෝ ශ්‍රී ලංකාවට පැමිණෙන්නා වූ යම් තැනැත්තකු විසින්, තමා රැගෙන යනු ලබන විදේශ විනිමයේ මුළු අගය එක්සත් ජනපද ඩොලර් 15000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක් ඉක්මවන්නේ නම්, පිළිවෙළින්, පිටත් වන හෝ පැමිණෙන තොටුපොළේ දී රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට යටත්ව, එම තැනැත්තා විසින් නීත්‍යානුකූලව අත්පත් කර ගත් ව්‍යවහාර මුදල් නෝට්ටු, බැංකු අණකර, චෙක්පත්, සංචාරක කාඩ්පත් ආදී ආකාරයෙන් වන විදේශ විනිමය ඕනෑම ප්‍රමාණයක් රැගෙන යනු ලැබිය හැකි ය. එම තැනැත්තා විසින්, එම විදේශ විනිමය අත්පත් කර ගැනීමට අදාළ ලේඛනගත සාක්ෂි රේගු දෙපාර්තමේන්තුව වෙත හෝ පසුව, එම තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටින්නේ නම්, මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත හෝ එම තොරතුරු ඉල්ලා සිටීමට නීතියෙන් බලය ලබා දී ඇති වෙනත් යම් තැනැත්තකු වෙත ලබා දීම අවශ්‍ය වන්නේ ය.

(2) එසේ වුව ද, ශ්‍රී ලංකාවට පැමිණෙන තැනැත්තකු විසින් එක්සත් ජනපද ඩොලර් 10,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක් ඉක්මවන්නා වූ ඉහත 1 වන ඡේදයේ (1) වන අනුඡේදය යටතේ තමා විසින් ශ්‍රී ලංකාවට රැගෙන එන ලද භාවිත නොකළ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු රැගෙන යාමට අදහස් කරනු ලබන අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට යන තැනැත්තකු විසින් එක්සත් ජනපද ඩොලර් 10,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක් ඉක්මවන්නා වූ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු රැගෙන යනු ලබන අවස්ථාවක දී එම තැනැත්තා විසින් ඒ සම්බන්ධයෙන් රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ ය.

(3) ශ්‍රී ලංකාවට පැමිණෙන තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීමේ කාර්යය සඳහා සිය ආමුඛ ආයෝජන ගිණුමට විදේශ ව්‍යවහාර මුදල් බැර කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවකදී, එම විදේශ ව්‍යවහාර මුදල්, ඒවායෙහි වටිනාකම නොසලකා, රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශ කළ යුතු අතර රේගු දෙපාර්තමේන්තුවේ මුද්‍රාව තබන ලද ප්‍රකාශය, බැර කිරීම තහවුරු කිරීම සඳහා රඳවා තබා ගැනීම පිණිස බලයලත් වෙළෙන්දා වෙත ලබා දිය යුතු ය.

2. ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තකු විසින්:-

(අ) ශ්‍රී ලංකා රුපියල් 20,000 ක අගයක් දක්වා ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් පිළිවෙළින්, ශ්‍රී ලංකාවෙන් පිටතට රැගෙන යාම හෝ ශ්‍රී ලංකාව තුළට රැගෙන ඒම; හෝ (ආ) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ අවසරයට යටත්ව මහ බැංකුවේ ව්‍යවහාර මුදල් අධිකාරීවරයා විසින් නිර්දේශ කරනු ලබන කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි සඳහා, ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් අපනයනය හෝ ආනයනය කිරීම, සිදු කරනු ලැබිය හැකි ය.

3. යම් බලයලත් වෙළෙන්දකු විසින් සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළදී හෝ ඒ සඳහා සහ සිය බලය ලබා දීමේ නියමයන් තුළ කටයුතු කිරීමේ දී අත්පත් කරගත් විදේශ ව්‍යවහාර මුදල්, ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

4. මේ කොටසේ කාර්යය සඳහා -

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

II වන කොටස

**විදේශ විනිමය සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් වන කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි**

1. ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තකු විසින් විදේශ විනිමය සන්තකයේ තබා ගැනීම.

(1) ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික යම් තැනැත්තකු විසින් එක්සත් ජනපද ඩොලර් 15,000ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු -

(අ) එම තැනැත්තාගේ විදේශ සංචාර සඳහා එම තැනැත්තා විසින් බලයලත් වෙළෙන්දකුගෙන් හෝ පරිසීමිත වෙළෙන්දකුගෙන් මිල දී ගනු ලැබ, ශ්‍රී ලංකාවට නැවත පැමිණීමේ දී භාවිත නොකළ ව්‍යවහාර මුදල් ලෙස ආපසු ගෙන එනු ලබන විදේශ ව්‍යවහාර මුදල්; හෝ

(ආ) එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකු වෙත විදේශයන්හි ලබාදෙන ලද සේවාවක් හෝ සපයන ලද භාණ්ඩයක් සඳහා වන ගෙවීම් ලෙස හෝ වෙනත් යම් නීත්‍යානුකූල මූලාශ්‍රයකින් එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර දී ලද විදේශ ව්‍යවහාර මුදල්; හෝ

(ඇ) සංචාරය කිරීමේ අරමුණ වෙනුවෙන් එම තැනැත්තා විසින් සිය පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් ආපසු ලබා ගත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු,

වන්නේ නම්, මෙහි 2 වන ඡේදයේ සඳහන් කාලසීමාව පිළිබඳ සීමා කිරීම් නොසලකා ඕනෑම කාලසීමාවක් දක්වා සිය සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.

(2) (අ) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකුට එම තැනැත්තා විසින් සපයන ලද භාණ්ඩ හා සේවා සඳහා භාර ගත් විදේශ ව්‍යවහාර මුදල්, තම සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.

(ආ) තීරු බදු සහනයක් යටතේ ශ්‍රී ලංකාවේ වරායක දී හෝ ගුවන් තොටුපළක දී ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරට යන මගීන් වෙත, භාණ්ඩ හා සේවා සැපයීම සඳහා අවසරලත් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික තැනැත්තකු විසින්, එම මගියා නේවාසික වුව ද නේවාසික නොවූව ද, එම මගියාට භාණ්ඩ හා සේවා සැපයීම සඳහා එම මගියාගෙන් භාර ගත් විදේශ ව්‍යවහාර මුදල් රඳවා තබා ගනු ලැබිය හැකි ය.

(ඇ) මේ ඡේදයේ විධිවිධාන යටතේ විදේශ විනිමය අත්පත් කර ගත් තැනැත්තකු විසින්, එසේ භාර ගත් විදේශ ව්‍යවහාර මුදල් ඒ බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු, එම විදේශ ව්‍යවහාර මුදල් භාර ගත් තැනැත්තාගේ නමට ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කිරීමෙන් හෝ බලයලත් වෙළෙන්දකුට විකිණීමෙන් තොරව, භාරගත් දිනයේ සිට දින හතක් (7) ඉක්මවන කාලසීමාවක් දක්වා රඳවා තබා ගනු නොලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකු විසින් තමා ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින විට දී නීත්‍යානුකූලව විදේශ ව්‍යවහාර මුදල් අත්පත් කර ගත්තේ නම් හෝ බලයලත් වෙළන්දන් හෝ පරිසීමිත වෙළෙන්දන් සමඟ පවත්වා ගෙන යනු ලැබූ විදේශ විනිමය ගිණුම්වලින් විදේශ ව්‍යවහාර මුදල් ආපසු ලබා ගත්තේ නම්, එවැනි විදේශ ව්‍යවහාර මුදල් ඕනෑම ප්‍රමාණයක්, එවැනි තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ සිටින විට දී සිය සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.

එසේ වුව ද, එම තැනැත්තා විසින්, විදේශ විනිමය අත්පත් කර ගැනීමට අදාළ ලේඛනගත සාක්ෂි, රේගු දෙපාර්තමේන්තුව වෙත හෝ පසුව, එම තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටින්නේ නම්, මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත හෝ එම තොරතුරු ඉල්ලා සිටීමට නීතියෙන් බලය ලබා දී ඇති වෙනත් යම් තැනැත්තකු වෙත හෝ ලබා දිය යුතු ය.

2. විදේශ විනිමය රඳවා තබා ගැනීමට අදාළ කාලසීමාව පහත සඳහන් පරිදි විය යුතු ය :-

(1) තමා විසින් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක සඳහන් කාර්යයක් සඳහා එම බලයලත් වෙළෙන්දාගෙන් හෝ පරිසීමිත වෙළෙන්දාගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර මුදල් එකී කාර්යය සඳහා භාවිත නොකරන යම් තැනැත්තකු විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය නොකර, එම විදේශ ව්‍යවහාර මුදල් ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාලසීමාවක් දක්වා රඳවා තබා ගනු නොලැබිය යුතු ය.

(2) (අ) තමා විසින් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක සඳහන් කාර්යයක් සඳහා එම බලයලත් වෙළෙන්දාගෙන් හෝ පරිසීමිත වෙළෙන්දාගෙන් විදේශ ව්‍යවහාර මුදල් ලබා ගෙන ඉන්පසු එකී විදේශ ව්‍යවහාර මුදල් හෝ ඉන් කොටසක් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එනු ලබන යම් තැනැත්තකු විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය නොකර එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එන ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාලසීමාවක් දක්වා රඳවා තබාගනු නොලැබිය යුතු ය.

(ආ) එසේ වුව ද, සංචාරය කිරීමේ කාර්යය සඳහා 1 වන ඡේදයේ (1)වන අනුඡේදයේ (අ) අයිතමය යටතේ එක්සත් ජනපද ඩොලර් 15,000ක සමුච්චිත අගයක් දක්වා හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ලබා ගත් තැනැත්තකු, එම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු සමග විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කිරීම සඳහා අවසර ලබන්නේ ය.

(3) රැකියාවක හෝ වෘත්තියක නිරත වීම සඳහා හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට නික්ම ගොස් එකී රැකියාවෙන්, වෘත්තියෙන් හෝ ව්‍යාපාරයෙන් විදේශ ව්‍යවහාර මුදල් උපයාගෙන හෝ ලබා ගෙන එම විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එනු ලබන යම් තැනැත්තකු එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය නොකර හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධානවලට අනුකූලව එම තැනැත්තා විසින් විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි විදේශ විනිමය ගිණුමකට බැර නොකර හෝ එම විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එන ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාලසීමාවක් දක්වා රඳවා තබා ගැනීමට හිමිකම් නොලැබිය යුතු ය.

3. මේ කොටසේ කාර්යය සඳහා -

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"පරිසීමිත වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

02 - 391

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.